චක්‍රලේඛ අංක:- 01/2003

සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2003.09.23

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

208:14 වැ.ප. හා 208:15 වැ.ප. අදාල සුදුසුකම්
සංශෝධනය කිරීම

සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති සමුපකාර සමිතිවල තනතුරු සඳහා යෝජිත වැටුප් පරිමාණය හා සුදුසුකම් - 1993, ධවලේ දැක්වෙන 208:14 වැ.ප. වෙළඳසැල් කළමණාකරු තනතුරට හා 208:15 වැ.ප. වෙළඳසැල් කළමණාකාර තනතුරට අදාල සුදුසුකම් පහත දක්වා ඇති ආකාරයට 2003.09.16 දින සිට බල පැවැත්වෙන පරිදි සංශෝධනය කරන ලද බව බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

තනතුරේ නම:- වෙළඳසැල් කළමණාකරු

වැටුප් පරිමාණය අංකය:- 208:14

වැටුප් පරිමාණය :- 1060-25X10-35X5-1485

වයස් සීමාව :- අවම වයස අවුරුදු 23 කි. උපරිම වයස අවුරුදු 45 කි.

තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

(අ) සමුපකාර සේවක 15 වන වැටුප් පරිමාණයේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්ද හෝ සමුපකාර සේවක 16 වන වැටුප් පරිමාණයේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවුරුදු 04 කට නොඅඩු පළපුරුද්ද

හෝ

(ආ) සමුපකාර සේවක(සාමාන්‍ය පෙළ) සහතිකය/ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) අංක ගණිතය/ වානිජ අංක ගණිතය/ ගණිතය හා සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සාමාර්ථය

අදාල ක්ෂේත්‍රය පිළිබඳ තනතුරක පළපුරුද්ද ලබා තිබීම කෙරෙහි වැ[illegible] සැලකිල්ලක් දක්වනු ලැබේ.

.....{02 පිටුවට

මගේ අංකය: බප/සසේකො/ලේ/නිර්
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.)
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2003.12.04

බස්නාහිර පළාතේ
සියලුම සමුපකාර සමිතිවල
ගරු සභාපතිවරුන් වෙත,

<u>අනියම් සේවකයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම</u>

ඔබ සමිතිය යටතේ දැනට සේවය කරනු ලබන අනියම් සේවකයන් පිළිබඳ සේවකයා පිළිබඳ විස්තර ලබා ගැනීමට මෙම කොමිෂන් සභාව අදහස් කර ඇත. ඒ අනුව ඒ එක් එක්/පහත දැක්වෙන විස්තර ඇතුලත් උපලේඛනයක් සකස් කොට සති දෙකක් ඇතුලත මා වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිමි.

X. නම:-
X. වයස :-
X. ස්ථිර පදිංචි ලිපිනය:-
X. දරන තනතුර:-
X. තනතුරට පත් කළ දිනය:-
X. අධ්‍යාපන සුදුසුකම්:-

02. ඉහත සඳහන් විස්තරවලට අමතරව දැනට අනුමතව ඇති පිරිස් බල තක්සේරුව අනුව මෙම සේවකයන් ගේ සුදුසුකම් මත ඔවුන් අන්තර්ග්‍රහණය කළ හැකි තනතුරුවල පුරප්පාඩු තිබේද? යන්නත් වාර්තා කරන්න.

03. දැනට පුරප්පාඩුව පවතින තනතුරු පිළිබඳ විස්තරයක් ද ලැබීමට සලස්වන්න.

කේ.තේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. ලේකම්, සමුපකාර, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යංශය (බ.ප.)
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
3. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ )
4. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව